සාර්ථක තොරතුරු ගවේෂණයකට

අපි සූදානම්

වයඹ ප්‍රාදේශීය මාධ්‍යවේදීහු පවසති

2009 අප්‍රේල් 1-3 හා 28-30 දිනවල වයඹ පළාත් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වෙනුවෙන් සංවිධානය කළ ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳ පුහුණු වැඩමුළු දෙකම ඊට සහභාගීවූ මාධ්‍යවේදීන් තුළ විශාල ආකල්පමය වෙනසක් ඇතිකරවීමට හේතුවී තිබිණි. ඔවුන්ගේ ප්‍රතිචාර ඊට සාක්ෂි සැපයීය.

"මට මුහුණදීමට සිදුවූ අමිහිරි අත්දැකීම් මත දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වීම කලකට පෙර මා අතහැර දැමුවා. පසුගිය කාලය තුළ මාධ්‍යවේදියකු ලෙස දූෂණය ගැන මා කිසිවක් ලියා නැහැ. එහෙත්, දූෂණය හා ගවේෂණාත්මක වාර්තාකරණය පිළිබඳ වැඩමුළුව ආරම්භ කරමින් හිතීඳු වැදිලෑමුණ මහතා පළකළ අදහස් මා තුළ යම් සසලා බවක් ඇතිකළා. මගේ ආත්ම විශ්වාසය හීනවීම හා පරාජිත හැඟීම, සමාජයට බලපාන පරිමාව පිළිබඳව අවබෝධවීමත් සමග මට තවදුරටත් හිඟඬව සිටීමට නොහැකි සෙයක් තදින් දැනෙන්නට වුණා. ඇත්තටම වැඩමුළුව පුරා විවිධ ක්ෂෙත්‍ර සම්බන්ධයෙන් ලැබුණු දැනුම් සම්භාරයත් එක්ක මට ආත්ම විශ්වාසයෙන් යුතුව මාගේ වගකීම් ඉටුකරන්න පුළුවනි".

"අපි පසන හසුරවමින් කරගෙදර් ආචාර ධාර්මිකව හිවැරදි ආකාරෙයන් සිදුකිරීම ... ඇත්තටම ඒක විශාල අභියෝගයක්. ඒත් ඒ අභියෝගය ජයගැනීමට උත්සාහ දැරීමත් එක්ක අප කරනදේට මොනතරම් වටිනා කමක් ලැබෙනවද ?

"අපි වැඩකරන්න ගියාම සමහර තැන්වලදී හොඳන්නකම නිසා හිරවෙනවා. විශේෂයෙන්ම හිතීමය කාරණා වලදී. අපහාසය පිළිබඳ හිතිඳු පුංචිහේවා මහත්තයගේ දේශනයට මීට අවුරුදු 10 කට කලින් සවන්දෙන්න ලැබුණහම් පසුගිය කාලේ මට ඇතිඇවුණු ප්‍රශ්න වලින් 50% කින් වීතරම බේරෙන්න තිබුණා." වැඩමුළුවට සහභාගීවූ වැඩිහිටි මාධ්‍යවේදියෙක්, අත්දැකීම් හුවමාරු කරගැනීමට ලැබුණ ඉසිමුවකදී ප්‍රකාශ කළේ කෘතඥතාපූර්වකය.

පුහුණුකරුවන් හා පුහුණුවන්නන් අතර අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩමුළුවක ස්වරූපයෙන් සංවිධානය කර තිබූ මෙම වැඩමුළු දෙක සඳහා වයඹ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, ජාතික රූපවාහිනිය, සිරස මාධ්‍ය ජාලය, ටී.එන්.එල් ,ස්වර්ණවාහිනිය, දෙරණ, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, හිරු, නෙත්, රිවිර, ලංකාදීප, දිවයින, ලංකා, ලක්ධීම, අයිලන්ඩ්, ඩේලි මිරර්, එන්ගල් ජෝසප්, තිනකුරල් හා වියසිදුර ප්‍රාදේශීය පුවත්පත හියෝජනය කරමින් සිංහල හා ද්විභාෂ ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් 44 දෙනෙකු සහභාගී වූහ.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා හා ෆෙඩ්රික් ඊබර් පදනම ඒකාබද්ධව සංවිධානය කළ මෙම වැඩමුළුවේ පුහුණුකරුවන් වශයෙන් ගවේෂනාත්මක මාධ්‍යවේදී පෙරේදූල ජයන්ත හා TISL මාධ්‍ය හිලධාරී ආනන්ද ජයසේකර කටයුතු කළ අතර එහි සම්පත් දායකයින් ලෙස හිතිඳු එස්. පී. පුංචිහේවා, හිතිඳු ජේ.සී. වැදිලෑමුණ, TISL මාධ්‍ය උපදේශක ඩී.සී.රණතුංග, TISL සංගිමේදාන ඒකකයේ අධ්‍යක්ෂ සංජය සේනානායක , TISL ශක්‍යතා ප්‍රවර්ධන අංශයේ කළමණාකරු ධනුෂ්ක විජේකෝන් හා උළුප පුජා ගුවන් විදුලියේ මාධ්‍යවේදී ලසන්ත ද සිල්වා යන මහත්වරු සහභාගී වූහ.

සිවිල් සමාජ සංවිධානවල සුපිළිපන්භාවය උදෙසා ස්වර්ණමය රීති

ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණින් සිවිල් සංවිධාන සඳහා අනුගමනය කළ හැකි "ස්වර්ණමය රීති" මාලාවක් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය(TISL) විසින් හඳුන්වා දී තිබේ.

"රාජ්‍ය හොවන සංවිධානවල වගවීම හා විනිවිදභාවය කෙරෙහි මහජනතාව දැඩි අවධානයකින් පසුවන මෙවැනි වකවානුවක සිවිල් සමාජ සංවිධාන සිය දැක්ම, මෙහෙවර, වටිනාකම් හා ප්‍රතිපත්ති පිළිබඳ පැහැදිලි දර්ශනයක් සහිතව ක්‍රියාත්මක විය යුතුයි. එසේම සංවිධාන තුළ කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුත් මූල්‍ය ප්‍රතිපත්තියක් හා ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාමත්, මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබාගතහැකි ක්‍රමවේදයක් හඳුන්වාදීමත් වැදගත් වේ. ඒ සඳහා මෙම ස්වර්ණමය රීති මාලාව කෙරෙහි අවධානය යොමුකිරීම බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත."යි මාර්තු 24 වැනිදා ඒ පිළිබඳව සිවිල් සංවිධාන දැනුම්වත් කිරීමේ සභාවට සහභාගීවෙමින් TISL හියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ රුක්ෂණ නානායක්කාර මහතා ප්‍රකාශ කළේය.

යෝජිත ස්වර්ණමය රීති මාලාවේ, යහපාලනය ගැන උනන්දුවක් දක්වන සිවිල් සමාජ සංවිධානයක මනා සංවිධිත ක්‍රියාකාරීත්වයක් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ මූලික කරුණු අටක් යටතේ විග්‍රහ කොට දක්වා තිබේ.

1. යහපාලනය (Good Governace)
2. නීත්‍යානුකූලභාවය (Legitimacy)
3. විනිවිදභාවය (Transparency)
4. වගවීම (Accontability)
5. සුපිළිපන්භාවය (Integrity)
6. නිරීක්ෂණය (Monitoring)
7. ස්ථාවරත්වය (Sustainability)
8. මානව සම්පත් (Human Resources)

මෙම ස්වර්ණමය රීති මාලාව පිළිබඳ පූර්ණ විස්තරයක් සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් අපගේ www.tisrilanka.org වෙබ් අඩවියට ඇතුළත්කර ඇති අතර එය අධ්‍යනය කර ප්‍රතිචාර දක්වන ලෙස TISL සිවිල් සමාජ සංවිධාන හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන මහජනතාවගෙන් ඉල්ලා සිටී.

දූෂණ දාමය බිඳලීමට ඔබට අවශ්‍යද?

දූෂණ විරෝධී නිබන්ධන තරගය -2009

අරමුණ

දූෂණයේ ප්‍රතිවිපාක පිළිබඳ මහජන දැනුම්වත් භාවය වැඩි දියුණු කිරීම හා ලංකාවේ තරුණ තරුණියන් තුළ දූෂණ මර්දන ක්‍රියාවලිය කෙරෙහි පවත්නා උනන්දුව වර්ධනය කිරීම.

සහභාගි විය හැක්කේ කාටද?

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන, ශ්‍රී ලංකා නීති විද්‍යාලය හා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යන විද්‍යාශතනවල අධ්‍යාපනය හදාරන සිසු සිසුවියන්.

භාෂා මාධ්‍ය

ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ

භාෂා මාධ්‍ය තුනෙන්ම ප්‍රථම, දෙවන, හා තෙවන ස්ථාන හිමිකරගන්නා ජයග්‍රාහකයින් වෙත වෙනම තෝරා ඔවුන්ට පිළිවෙලින් රු. 50,000, රු.30,000, රු.20,000 බැගින් මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ.

අංශ තුනෙන්ම හොඳම නිබන්ධන ඉදිරිපත් කරනු ලබන 10 දෙනෙකු තෝරා ඔවුන්ට කුසලතා සහතික පිරිනැමේ.

අයදුම් කරන්නේ කෙසේද?

පහත තොරතුරු ඇතුළත් අයදුම්පතක් සකස් කර 2009 ජූලි 15 වන දිනට පෙර පහත ලිපිනයට එවිය යුතුය.

සම්පූර්ණ නම :
ලිපිනය :
දුරකථන :
ඊ- මේල් :
නියෝජනය කරන උසස් අධ්‍යාපන ආයතනයේ නම සහ ලිපිනය :
අධ්‍යයන වසර / පීඨය - අංශය :
ශිෂ්‍ය අංකය :
අයදුම්කරන භාෂා මාධ්‍යය :

දූෂණ විරෝධී නිබන්ධන තරගය -2009
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
28/1, බුලර්ස් පටුමග, කොළඹ 07

විද්‍යුත් තැපෑල - *competition@tisrilanka.org*

වැඩිදුර තොරතුරු සඳහා 011-5627432 ට නෙළලි හෝ දුලීකා අමතන්න.

පුහුණු වැඩමුළුවේ එක් අවස්ථාවක්

සුපිළිපන්

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා - පුවත් හසුන 05 වන වෙළුම අප්‍රේල් 2009

අපි දූෂණය අවම කළා

ආගමන විගමන පාලක පී.බී. අබේකෝන්

වංචා දූෂණ හා එහි ප්‍රතිවිපාක පිළිබඳව දෙපාර්තුමේන්තු කාර්ය මණ්ඩලය දැනුම්වත් කිරීම තුළින්, ආගමන හා විගමන දෙපාර්තුමේන්තුව පිළිබඳව කාලාන්තරයක් තිස්සේ මහජනතාව අතර පැවති අයහපත් හැඟීම් මේ වනවිට මුළුමනින්ම වෙනස් කිරීමට හැකිවී ඇතැයි ආගමන විගමන පාලක පී.බී. අබේකෝන් මහතා පවසයි.

පසුගිය වර්ෂය තුළ දෙපාර්තුමේන්තුවේ පහළම මට්ටමේ සිට ඉහළම මට්ටම දක්වා හිලධාරීන්ට මෙම දැනුම ලබාදීම සඳහා විවිධ වැඩසටහන් කිහිපයක් සංවිධානය කළ අතර, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් බලාත්මක හිලධාරීන් ඉලක්ක කරගනිමින් සංවිධානය කළ වැඩමුළු හතර මගින් හිලධාරීන් සහ සේවකයින්ගේ ආකල්පවල විශාල ධනාත්මක වෙනසක් සිදුවී ඇතැයි ආගමන විගමන පාලකවරයා වැඩිපුරටත් පෙන්වාදෙයි.

"මෙම වැඩමුළුවලට මමත් සහභාගීවුණා. පුහුණුවට පෙර සිටි සහ පුහුණුවෙන් පසු අපේ කාර්ය මණ්ඩලය අතර විශාල වෙනසක් තිබෙනවා. විශේෂයෙන්ම මහජනතාව සමග ගණුදෙනු කරන ආකාරය සම්බන්ධ කාරණා වලදී. නිදර්ශනයක් ලෙස "බෑ" කියන වචනය කියන ආකාරය අනුව මහජනතාව එය තේරුම් ගන්නා විවිධ ආකාර පවතිනා බව අපේ කාර්ය මණ්ඩලය මේ වැඩමුළු වලින් පසුව දැඩි ලෙස සැලකිලිමත් වන බව පෙනුණා.

ඕනෑම ආයතනයක වංචා දූෂණවලට ඉඩ විවරවන්නේ හිලධාරීන් හා සේවකයින්ගේ නොදැනුවත්භාවය නිසයි. ඒ නිසා ආයතනය හා එක්වා කටයුතු කරන බාහිර පුද්ගලයින්ට සහ ආයතන වලට විවිධ ජාවාරම්වල යෙදීමට අවස්ථාව සැලසෙනවා. කාර්ය මණ්ඩලය දූෂණය පිළිබඳව දැනුම්වත් කරවීම මගින් ආයතනයක් තුළ විශාල පෙරළියක් ඇතිකළ හැකියි. මහජන ප්‍රතිචාර අනුව, අන්තිමට මේ වනවිට අප ඒ පෙරළිය සිදුකර තිබෙනවා.

විශේෂයෙන් TISL වැඩමුළුවේදී රටවල් කිහිපයක රාජ්‍ය හිලධාරීන් දුප්පත්, අහිංසක මිනිසුන් තාලාපෙළා පිඩාවට පත්කරන ආකාරය ගැන පෙන්වූ වීඩියෝ දර්ශන කිහිපය අපේ හිලධාරීන් තුළ දැඩි බලපෑමක් ඇතිකිරීමට හේතුවී තිබුණා."

අඩුපාඩු හඳුනාගෙන, එම අඩුපාඩු නිවැරදි කිරීමේ සාමූහික ප්‍රයත්නයක යෙදී සිටින රාජ්‍ය දෙපාර්තුමේන්තුවක් ලෙස "මහජන පැමිණිලි" පිළිබඳව තමන් දැඩි අවධානයකින් පසුවන බවත්, දෙපාර්තුමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් මහජනතාවට පෙනීයන ඕනෑම අඩුපාඩුවක් නාමිකව හෝ නිර්නාමිකව තමාවෙත දැනුම්දෙමින් ආගමන හා විගමන දෙපාර්තුමේන්තුව තවදුරටත් වර්ධනත් කිරීම සඳහා සහය වන ලෙසත්, ආගමන විගමන පාලකවරයා මහජනතාවගෙන් ඉල්ලා සිටී.

අධ්‍යාපනයේ දූෂණ පිළිබඳව TISL අධ්‍යයන වාර්තාව එළිදැකී

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දූෂණ සිදුවන ආකාරය සහ ප්‍රමාණය පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා මගින් සිදුකළ අධ්‍යයනයේ වාර්තාව ජූනි මාසයේදී එළිදැක්වීමට නියමිතය.

දෙමාපියන්, ගුරුවරුන්, විදුහල්පතිවරු, ආදී සිසුන්, සිවිල් සමාජ සංවිධාන, අධ්‍යාපන අමාත්‍යාංශයේ පළාත්, කලාපීය සහ අමාත්‍යාංශ හිලධාරීන්, ආදී විවිධ පිරිස් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්න මාලා ආශ්‍රය කරගනිමින් මහාචාර්ය අමරසිරි ද සිල්වා ප්‍රමුඛ කංඩායමක් විසින් මෙම අධ්‍යනය සිදුකර තිබේ.

සුපිළිපන්

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
පුවත් හසුන
05 වන වෙළුම අප්‍රේල් 2009

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
28/1, බුලර්ස් පටුමග, කොළඹ 07

දුරකථනය - 011 2501474
ෆැක්ස් - 011 2592287
විද්‍යුත් තැපෑල - nia@tisrilanka.org
වෙබ් අඩවිය - www.tisrilanka.org

කතුවැකිය

ශ්‍රී ලංකා ලේ බැංකුව කල් ඉකුත් වූ රුධිර ග්‍රෝක්ෂා පෙරණ කට්ටල් භාවිතා කරමින් සිදු කරනලද වංචාවක් පසුගියදා ජනමාධ්‍ය මගින් හෙළිදරව් කෙරුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එම පද්ධතියේ විශාල වෙනස්කම් රැසෙක් සිදුකරනවාට අමතරව මිනිස් ජීවිත රාශියක් බේරාගැනීමටද අවකාශ සැලසිණි. එම වංචාව හෙළිදරව් කිරීමට මුල්වී ක්‍රියා කළේ ඉතාම සාමාන්‍ය මට්ටමේ සේවකයින් කිහිප දෙනෙකි.

රටක දූෂණය හා බලය අපයෝජනයට එරෙහිව ජනමාධ්‍යයට ඉටුකළහැකි මෙහෙය අසීමිතය. විවිධ ක්ෂේත්‍රයන්හි පතාක යෝධයින් බරපතල වංචා - දූෂණවල යෙදෙන විට නිදහස් මාධ්‍යයට පුංචි මිනිසුපු සමඟ එකතු වී ඒ යෝධයින්ගේ වැරදි ලෝකයාව විවරකර පෙන්වීමට අවකාශ හිමි වේ. ඒ නිසාම දූෂිතයින් හැඹවිටම ජනමාධ්‍ය හා නිදහස් ජනමාධ්‍යවේදීන් සලකනුයේ තමන්ගේ පරම තර්ජන ලෙසය.

පසුගිය කාලවකවානුව තුළ විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ දූෂණ හෙළිදරව් කිරීමේ නිරත වූ ජනමාධ්‍ය ආයතන හා ජනමාධ්‍යවේදීන් රැසකට විවිධ තර්ජනයන්ට ලක්වීමට සිදුවිය. රටක ජනමාධ්‍ය නිදහසට තර්ජන එල්ල වීම යනු එරට ජනතාවගේ තොරතුරු දැනගැනීමේ නිදහසට තර්ජන එල්ලවීමකි.

මාධ්‍ය මර්දනය කිරීමට වෙරදරන්නන්ට සිය පටු අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීමට හැකියාව ලැබෙන්නේ මහජනතාව තමන්ගේ අයිතිවාසිකම් පිළිබඳව නිහඬව සිටිනා තාක්කල් පමණකි.

සුපිළිපන් දේශයක් උදෙසා සිදුකළ අපරිමිත කැපවීම වෙනුවෙන්

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ප්‍රණාමය

ශ්‍රී ලංකාව සුපිළිපන් දේශයක් බවට පත්කිරීමේ දැක්මෙන් යුතුව, සිය ජීවිත කාලය තුළදී ඒ වෙනුවෙන් අසීමිත වෙහෙසක් දැරූ පුරවැසියන් තිදෙනෙක් ඉකුත් ජනවාරියේදී අපෙන් සමුගත්හ.

ජනවාර 03 වැනිදින සාහසික ලෙස ඝාතනයට ලක්වූ සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග මහතා, ශ්‍රී ලංකාවේ දූෂණවලට එරෙහිව පුරෝගාමී මෙහෙවරක නිරතව සිටි අතීත ජනමාධ්‍යවේදියෙකි. ඔහු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් අන්තර්ජාතික සුපිළිපන් ප්‍රණාමයෙන් (Integrity Award) පිදුම්ලද ප්‍රථම ජනමාධ්‍යවේදියාය. ලසන්ත වික්‍රමතුංගයන් මාධ්‍ය නිදහස වෙනුවෙන් ඉටුකරන ලද සුවිශේෂී මෙහෙය අඟවයීමට ලක්කරමින් පසුගියදා යුනෙස්කෝ අන්තර්ජාතික සම්මානයෙන්ද ඔහු පුදනු ලැබීය.

වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම දූෂණයට එරෙහි, සුපිළිපන් පුරවැසියෙකු ලෙස ජීවත් වූ උපනන්ද සේනාරත්න මහතා සමස්ථ රාජ්‍ය සේවයටම ආදර්ශයක් ලබාදුන් පිරිගරුක රාජ්‍ය නිලධාරියෙකි. දේශපාලනඥයින්ගේ පටු අවශ්‍යතා ඉටුකරගැනීමට දැරූ උත්සාහයෙන් හමුවේ ඔහු දිවිහිමියෙන් ඊට එරෙහිව සටන් වැදුනේය. එසේම දේශපාලඥයින් බලය අයථා ලෙස පාවිච්චි කිරීම නිසිය ඉදිරියේ අභියෝගයට ලක්කරමින්, කිරුමි මිනුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා වශයෙන් එම දෙපාර්තමේන්තුව රැකගැනීම සඳහා උපනන්ද සේනාරත්න මහතා සිදුකළ අඛණ්ඩ අරගලය ඇඟයීමට ලක්කරමින් 2005 වසරේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ජාතික සුපිළිපන් ප්‍රණාමය එතුමාට හිමිවිය.

සුපිළිපන්භාවය හා ආදර්ශමත් ක්‍රියා පටිපාටිය අතින් අතිවිශිෂ්ට ගණයෙහිලා සැලකිය හැකි ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු වූ මාර්ක් ප්‍රනාන්දු මහතාද ශ්‍රී ලංකාව සුපිළිපන් දේශයක් බවට පත්කිරීමේ මෙහෙවර උදෙසා සුවිශේෂී දයකත්වයක් සැපයූ ගෞරවනීය පුරවැසියෙකි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු වශයෙන් එතුමා විසින් ලබාදෙන ලද තීන්දු රටේ විනිවිදභාවය හා යහපාලනය කෙරෙහි පුළුල් හා ප්‍රගතිශීලී බලපෑමක් ඇතිකළ අතර එම තීන්දු පරිපාලන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියේ පෙරළිකාර වෙනසක් ඇතිකිරීමට ද හේතු විය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා හි කටයුතු වෙනුවෙන් හැඹවිටම ආශිර්වාද කළ පුද්ගලයෙකු වූ එතුමා, ප්‍රථම ජාතික සුපිළිපන් ප්‍රණාම උළෙලේ ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගීවෙමින් එම උළෙලට ගෞරවනීය පිළිගැනීමක් ලබාදුන්නේය. එසේම 2007 වසරේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ජාතික සුපිළිපන් ප්‍රණාම කමිටුවේ සභාපතිවරයා වශයෙන් ක්‍රියාකළේද ඒ මහතා ය.

මෙම ගෞරවනීය පුරවැසියන් තිදෙනාම ශ්‍රී ලංකාව වෙනුවෙන් ඉටුකරන ලද විශිෂ්ට මෙහෙවර සම්බන්ධයෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ඔවුන් වෙත සිය ගෞරවය හා ආචාරය පුදකර සිටී.

බැංකු හා මූල්‍ය කොමිසමක් ඉල්ලයි

මෙරට මූල්‍ය ආයතන කීපයක ඇතිවූ අර්බුදය හේතුවෙන් අනාගතයේදී රටේ ආර්ථික සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරභාවය රැකගැනීම පිළිබඳව කරුණු හදාරා සුදුසු ක්‍රියාමාර්ගයන් යෝජනා කිරීම සඳහා බැංකු සහ මූල්‍ය කොමිෂන් සභාවක් පත්කරන ලෙස ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය රජයට යෝජනා කර ඇත.

පෞද්ගලික අංශය, වෘත්තිකයන්, විද්වතුන්, මාධ්‍ය නියෝජිතයින් සහ සිවිල් සමාජ නියෝජිතයින් සහභාගිවූ සාකච්ඡාවකින් පසු මෙවන් කොමිසමක අවශ්‍යතාවය පෙන්වාදෙමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙත යැවූ ලිපියක් මගින් මෙම යෝජනාව ඉදිරිපත් කර තිබේ.

මූල්‍ය කටයුතුවල යෙදී සිටින ආයතන පිළිබඳව මහජන විශ්වාසය නොවැරැදීමේ අවශ්‍යතාවය පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරුණි.

මෙම සාකච්ඡාවට පසුව TISL ආයතනයේ මූලිකත්වයෙන් සංවිධානය කෙරුණු විද්වතුන්ගේ හමුවකදී පෙනීගියේ මූල්‍ය ක්ෂේත්‍රයේ විනිවිදභාවය සහ වගවීම වැනි කරුණුවල ඇති අඩුපාඩුකම් හේතුවෙන් අර්බුදකාරී තත්ත්වයක් ඇතිවී තිබෙන බවයි. ගෝලීය මූල්‍ය අර්බුදයට වඩා ක්ෂේත්‍රයේ අහිසි කළමනාකාරීත්වය සහ ක්‍රමානුකූල පාලන ක්‍රියාවලියක් නැතිකම මේ තත්ත්වයට තුඩුදී ඇතැයි මෙම සාකච්ඡාවේදී පෙන්වා දෙනු ලැබීය.

අවංකත්වයට හා පිරිගරුත්වයට උපහාර පිදෙන "ජාතික සුපිළිපන් ප්‍රණාම" සඳහා දූෂණය අවම කිරීමට හෝ වැළැක්වීම වෙනුවෙන්, අඛණ්ඩ අරගලයක නිරතවූ, ශ්‍රී ලාංකික පුද්ගලයින් හා සංවිධාන පිළිබඳව නාමයෝජනා කැඳවනු ලැබේ.

යෝජිත පුද්ගලයා හෝ සංවිධානය විසින් සිදුකරන ලද ක්‍රියාව පුරෝගාමී, නව්‍ය හා ධෛර්යයවන්ත ක්‍රියාවක් විය යුතුය.

මෙම සම්මානය සඳහා ඕනෑම පුද්ගලයකු /රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක්/ සිවිල් සමාජ සංවිධානයක් පිළිබඳව නාමයෝජනා ඉදිරිපත් කළ හැකි අතර තමා විසින්ම තමාගේ නාමයෝජනාව ඉදිරිපත් කළ නොහැක.

නාමයෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධ විස්තර සඳහා

ජාතික සුපිළිපන් ප්‍රණාම - 2009
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
28/1, බුලර්ස් පටුමග, කොළඹ 07
ෆැක්ස් - 011 2592287
විද්‍යුත් තැපෑල - nia@tisrilanka.org
වෙබ් අඩවිය - www.tisrilanka.org

වැඩි විස්තර සඳහා 011 5627432 ට නෙළලි අමතන්න

නාමයෝජනා භාරගන්නා අවසාන දිනය : 2009 අගෝස්තු 31

සුදුස්සන් තෝරා ගැනීම ස්වාධීන විනිසුරු මඬුල්ලක ගේ තීරණය පරිදි සිදු වේ.
සම්මාන ප්‍රදානය 2009 දෙසැම්බර් 09 වන ද අන්තර් ජාතික දූෂණ විරෝධී දිනයේදී සිදුකෙරේ.

ජාතික සුපිළිපන් ප්‍රණාම 2009

NATIONAL INTEGRITY AWARDS 2009

රාජ්‍ය සේවයේ යහපත් වෙනසක් ඇතිකළ හැකියි

අල්ලස් - දූෂණ පිළිබඳ පුහුණුව ලැබූ රාජ්‍ය සේවකයෝ පවසති

රටක දූෂණ මට්ටටම මැනබැලීම සඳහා යොදා ගැනෙන දූෂණ සංජානන දර්ශකය අනුව (CPI index) ශ්‍රී ලංකාවේ තත්ත්වය 2002 වසරේ සිට එන්න එන්නම තරක අතට හැරෙමින් පවතී.

රටක දූෂණය අවම කිරීම වෙනුවෙන් එරට රාජ්‍ය සේවකයින්ට විශාල මෙහෙයක් ඉටුකළ හැකිය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය, ශ්‍රී ලංකා සංවිධාන පපාලන ආයතනය (SLIDA) හා රාජ්‍ය සේවයින්ගේ දූෂණයට එරෙහි එකමුතුව වන "සුපිරිසිදු දෑත්" සංවිධානය හා ඒකාබද්ධව පසුගිය වසරේ රාජ්‍ය හිලධාරීන් 36 දෙනෙකු පුහුණුකරවන් ලෙස පුහුණු කර, ඔවුන් ලවා දූෂණ විරෝධී දැනුම රාජ්‍ය සේවය තුළ දිප වාප්තවා පතුරුවා හැරීමේ උත්සාහයක නිරතවූ අතර එම්ගින් අපේක්ෂිත පුළිවල කවර ප්‍රමාණයකට සාක්ෂාත් කරගැනීමට හැකිවී ඇත්දැයි සොයා බැලීමට පසුගිය දිනෙක අපි පසු විපරමක යෙදුනෙමු.

මේ පුහුණුකරුවන් හා පුහුණුව ලැබූවන් පළකළ අදහස් ඇසුරෙන් සැකසුන විශේෂාංගයකි.

දූෂණ ත්‍රස්තවාදය ජයගත්තොත් අයවැය හිගයත් පියවිය හැකියි. එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර - ප්‍රදේශීය ලේකම් ගාල්ල කඩවත්තර

"මේ රටේ ත්‍රස්තවාදය ඉවරකළත් අපට නොපෙනෙන තවත් ත්‍රස්ත වාදයක් තිබෙනව, ඒක තමයි දූෂණය හා නාස්තිය. එම ත්‍රස්තවාදය ජයගත්තොත් රටේ අයවැය හිගය පවා පියවන්න පුළුවන් . අපි රාජ්‍ය අංශයේ අපේ හිලධාරීන් සමඟ මේ ගැඹුරු කාරණා ගැන සංවාදයකට ගියා. දේශනයක විලාසයෙන් මෙවැනි නිරස විෂයක් ඕනිස්සුන්ට ලබාදෙන්න අමාරු නිසා බැලූ බැල්මට දේශනයකුත් නොවන, සාකච්ඡාමය ස්වරූපයකුයි ඒ සඳහා යෙදාගත්තෙ. අපට ශ්‍රේෂ්ඨ අතීතයක්, තෝරුම්ගන්න බැරි වර්තමානයක් හා අපහැදිලි අනාගතයක් තිබෙනව. එය අපි වෙනස් කළ යුතුයි. අපි උත්සාහ කළේ ආකල්ප වෙනසක් තුළින් ඒ තත්ත්වය ඇතිකරන්නයි."

අපේ උත්සාහය සාර්ථකයි. ජී. එල් . වර්තන් පෙරේරා - ප්‍රාදේශීය ලේකම් අම්බලන්ගොඩ

"දූෂණයට එරෙහිව මා තුළ පැවති ආකල්ප පුහුණුකරුවකු ලෙස මගේ කාර්යය ඉටු කිරීමට සූදිකාල රැකුලක් වුණා. මම ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් පුහුණු හිලධාරියකු ලෙස කටයුතු කරනව. අල්ලස හා දූෂණයේ ප්‍රතිවිපාක ගැන රාජ්‍ය සේවකයාගේ මනසට වඩාත් සංවේදීව කතා කරන්නෙ කොහොමද කියන විෂය විෂයාස මගින් මා ප්‍රගුණ කළා. විශේෂයෙන්ම දූෂණය මැඩලීමේ ක්‍රමවේදයන් සූක්ෂම ලෙස යොදාගැනීමට මා උත්සාහ කළා. පුහුණුව ලැබූවන්ගේ ප්‍රතිචාර වලින් පෙනෙන්නේ එම උත්සාහය සාර්ථක වී ඇති බවයි."

අපේ ජීවිතවලට ලොකු වෙනසක් ඇතිකළා නදීකාන සමරවීර - නවන ග්‍රාම නිලධාරිණියක්

"රාජ්‍ය සේවය තුළ දූෂණය හා නාස්තිය සිදු වෙනව කියන එක මම හදිනි දැනගෙන හිටියා. හමුත් ඉන් රටේ සංවර්ධනයට සිදුවන හානිය මීලියන ගණනක් කියලු නම් මට පැහැදිලි අදහසක් තිබුණෙ නෑ. ග්‍රාම නිලධාරි කියන්නේ ග